# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත

## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்

## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE


| මගේ අංකය எனது இல. My Ref. | CSS/10/01/25/114 | ඔබේ අංකය உமது இல. Your Ref. | | දිනය திகதி Date | 2022.07. 28 |
|---|---|---|---|---|---|

ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (අභ්‍යන්තර විගණන) - 01/2022

දකුණු පළාතේ සියළුම,
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්,
ගණන් දීමේ නිලධාරීන්,

<u>පළාත් රාජ්‍ය ආයතන ඇගයීමේ මාර්ගගත (online) වැඩසටහන</u>

දකුණු පළාත් සභාවේ වැය ශීර්ෂ හිමි අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතන සහ ව්‍යවස්ථාපිත අධිකාරී ආයතනවල මූල්‍ය කළමනාකරණය හා කාර්ය සාධනය මාර්ගගත ක්‍රමයට (online system) ඇගයීම සඳහා වැඩසටහනක් දකුණු පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් සකස් කර ඇත.

මෙම ඇගයීමේ වැඩසටහන මූල්‍ය අනුකූලතා ඇගයීම හා කාර්ය සාධන අනුකූලතා ඇගයීම යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර මූල්‍ය අනුකූලතා ඇගයීම යටතේ කරුණු 70ක් සහ කාර්යසාධන අනුකූලතා ඇගයීම යටතේ කරුණු 40ක් ඇගයීමට ලක් කිරීමට නියමිතය. තවද මෙම ඇගයීම වසරකට වැඩසටහන් 2ක් ලෙස මාර්තු මස 31 දිනට හා සැප්තැම්බර් 30 දිනට අදාලව සිදු කරනු ලැබේ.

ඒ අනුව 2022 මාර්තු මස 31 දිනට නියමිත අදාල ආරම්භක ඇගයීමේ වැඩසටහන සඳහා මාර්ගගත ක්‍රමයට ලකුණු සලකුණු කිරීමට 2022.07.25 දින ඔබ වෙත විවෘත කරනු ලබන අතර ඇගයීම් ලකුණු සලකුණු කිරීමේ අවසාන දිනය 2022.08.07 දින වේ.

<u>ඇගයීම් වැඩසටහන ක්‍රියාත්මක කරන ආකාරය</u>

1. ඇගයීමේ වැඩසටහනට අදාල පද්ධතියට පිවිසීම සඳහා http://cs.sp.gov.lk/AuditQues සබැඳිය මගින් සම්බන්ධ වන්න.
2. ඇගයීම් වැඩසටහනට පිවිසීමට මේ සමඟ ඔබ වෙත ලබා දෙන පරිශීලක නාමය (user name) මුර පදය (pass word) භාවිතා කළ යුතුය.
3. ඔබ ආයතනයේ නම,වැය ශීර්ෂ අංකය ඇතුළු මූලික තොරතුරු පළමුව සටහන් කළ යුතුය.
4. ඊළඟ පියවර ලකුණු සටහන් කිරීම වන අතර ලකුණු සටහන් කිරීමේදී නිවැරදිව හා වගකීමෙන් යුතුව සටහන් කිරීමට වගබලා ගත යුතුය.
5. මූල්‍ය අනුකූලතා ඇගයීම කොටසෙහි එක් එක් කරුණ යටතේ සඳහන් කරුණු වලින් ඔබ ආයතනයට උපයෝගී හැකි ලකුණු අදාල කොටුව තුළ "√" සලකුණ යොදා සටහන් කළ යුතුය.(මුළු ලකුණු සංඛ්‍යාව 100)


ප්‍රධාන ලේකම් பிரதான செயலாளர் Chief Secretary 091 4944002 | කාර්යාලය காரியாலயம் Office 091 4119011 091 2226118 | ෆැක්ස් பெக்ஸ் Fax 091 2246299 | විද්‍යුත් තැපෑල மின் அஞ்சல் E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය இ தளம் Web site www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

6. කාර්ය සාධන අනුකූලතා ඇගයීම කොටසෙහි එක් එක් කරුණු යටතේ සඳහන් ලකුණු වලින් ඔබ ආයතනයට උපයාගත හැකි ලකුණු අදාල කොටුව තුළ "√" සලකුණ යොදා සටහන් කළ යුතුය.( මුළු ලකුණු සංඛ්‍යාව 100)
7. ඔබ විසින් සටහන් කළ ලකුණුවල නිරවද්‍යතාවය පරීක්ෂා කර සංශෝධන (Edit) සිදු කිරීමට අවස්ථාව ලබා දී ඇත.
8. අවශ්‍ය සංශෝධන සිදු කිරීමෙන් අනතුරුව අවසාන ඇගයීම් වාර්තාව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව වෙත මාර්ගගත ක්‍රමයට (Submit) නියමිත දිනට ප්‍රථමව යැවිය යුතුය.
9. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවට ඇගයීම් වාර්තා ලද පසුව මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන නිලධාරීන් මගින් නොපමාව නැවත පරීක්ෂා කරවා නිවැරදිතාවය තහවුරු කර ගැනීමට කටයුතු කරනු ලැබේ.
10. නිවැරදිතාවය තහවුරු කර ගත් අවසාන ඇගයීම් වාර්තාවේ මුළු ලකුණු සංඛ්‍යාව පදනම් කරගෙන අවසාන ප්‍රතිඵල තීරණය කරනු ලැබේ.
11. සියළුම ආයතන විසින් 2022.08.07 දිනට ප්‍රථම ඇගයීම් ලකුණු සටහන් කර එවිය යුතු අතර ප්‍රමාද වී ලකුණු සටහන් කිරීමට මෙම වැඩසටහන තුල අවස්ථාව නොලැබේ.

මෙම ඇගයීම් වැඩසටහන ක්‍රියාත්මක කිරීම මගින් පළාත් සභාවේ සියළු ආයතනවල ආයතනික ,පරිපාලන හා මූල්‍ය කළමනාකරණ පද්ධතීන් වැඩි දියුණු කර ගැනීමටත් කාර්යක්ෂමතාවය හා කාර්ය සාධනය ඉහල නංවා ගැනීමටත් බලාපොරොත්තු වේ. එසේම පාර්ලිමේන්තු රාජ්‍ය ගිණුම් කාරක සභාව මගින් දෙසැම්බර් 31 දිනට සිදු කරන මූල්‍ය හා කාර්ය සාධන ඇගයීමේදී ඉහල ලකුණු මට්ටමක් ලබා ගැනීමටත් වඩාත් සහය වනු ඇත.

එබැවින් ඔබ ආයතනයේ නම්කළ නිලධාරියෙකු මගින් මෙම ඇගයීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

ආර්.සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත.

පිටපත් - 1. අධ්‍යක්ෂ ජනරාල්,කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
2.ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති, දකුණු පළාත
3. අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්/ මුදල් /අයවැය)